වගා සහනාධාර චක්‍රලේඛ අංක: 29

මගේ අංකය: සං/ව.ආ/ප්‍රති
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ.
1990.09.21 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරු වන් වෙත.

අළුතින් තේ වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම
1991 වර්ෂය

උක්ත කරුණ පිළිබඳව මාගේ සං/අව/ප්‍ර/1 සහ 1990.07.20 දිනැති "වගා අවසරපත්‍ර නිකුත් කිරීම පිළිබඳ ඉදිරි වැඩපිළිවෙල" නමින් යුතු ලිපියට අතිරේකවයි.

02. 1991 වර්ෂය සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

(1) නියමිත දිනට ලැබී ඇති අළුත් වගා ඉල්ලුම්පත්‍ර පිළිබඳව මූලික පරීක්ෂණ කර තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි නිර්දේශ කර ඇති ඉල්ලුම්පත්‍ර සඳහා මෙයට යාකර ඇති අංක 01 උපලේඛණයේ දැක්වෙන ලිපිය මගින් ඉල්ලුම්කරුට තාවකාලිකව අවසර දෙන්න. දැනටමත් මූලික පරීක්ෂණ කර අවසරපත්‍ර නිර්දේශ කරමින් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් විසින් ප්‍රාදේශීය කාර්යාලයට එවා ඇති අළුත් වගා ඉල්ලුම්පත්‍රද ආපසු ඔවුන් වෙත ලබා දිය යුතු අතර, තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් විසින් යථෝක්ත ලිපිය අවසරපත්‍ර නිර්දේශිත ඉල්ලුම්කරුවන් වෙත යැවිය යුතුය.

(2) තාවකාලිකව අවසර දෙනු ලබන ඉල්ලුම්පත්‍ර පිළිබඳව තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි විසින් සිය මූලික පරීක්ෂණ වාර්තාවේ "තාවකාලික අවසරපත්‍රය නිකුත් කරන ලදී" යන්න ඉහළ වම් කෙළවරේ සටහන් කොට සිය කෙටි අත්සන හා දිනය යොදා ~~ප්‍රධාන~~ ප්‍රාදේශීය කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

(3) තාවකාලිකව අවසරපත්‍රයක් නිකුත් කිරීමේදී තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරිට තීරණය කිරීමට අපහසු ගැටලු සහගත ඉල්ලුම්පත්‍රයක් වේනොත් ප්‍රාදේශීය කළමනාකරු වෙත ඉදිරිපත් කොට එය නිරාකරණය කරගෙන තාවකාලිකව අවසර දීමට පුළුවන.

(4) (අ) තාවකාලික අවසරපත්‍ර යටතේ ඉඩමේ උදුරා දැමීමේ කටයුතු අවසන් කර ඇති විට ඉල්ලුම්කරුගේ දැනුම්දීමක් සහිතව හෝ රහිතව උදුරා දැමීමේ පරීක්ෂණය සිදු කර නියමිත ආකෘතිපත්‍රයේ වාර්තා කළ යුතු අතර, පහත සඳහන් කරුණුද එහි ඇතුළත් කළ යුතුය.

I. තේ පැළ සිටුවීමට අදහස් කරන වකවානුව

II. වගාවට පැළ සපයා ගන්නා අන්දම
(තමාගේම තවානෙන් පැළ සපයා ගන්නේ නම් අළුත් වගාව යටතේ

III. උදුරා දැමීමෙන් පසුව ඉදිරි වැඩ කටයුතුද සම්පූර්ණ කර ඇත්නම් සම්පූර්ණ කළ වැඩ කොටස් සඳහා අදාල ගෙවීම් වාර්තා සියල්ල ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව ඉල්ලුම්පත්‍ර පිටපත සහ ඊට අයත් ලිපිලේඛණ වගා/පොදු -7 මූලික පරීක්ෂණ වාර්තාව හා ඉහත ගෙවීම් වාර්තාද සමග ප්‍රාදේශීය කළමනාකරු වෙත එවිය යුතුය.

IV. ඉහත වාර්තාවල අඩංගු කරුණු අනුව නියමිත පරිදි වගා වැඩ කරන බවට වාර්තා වන තාවකාලික අවසරපත්‍ර වෙනුවෙන් ස්ථිර අවසරපත්‍ර ප්‍රාදේශීය කාර්යාලය මගින් නිකුත් කළ යුතුය.

(5) බැංකු ණය ඉල්ලුම්පත්‍ර සහිත මූලික පරීක්ෂණය මගින් නිර්දේශිත සහනාධාර ඉල්ලුම්පත්‍ර වෙනුවෙන් අවසරපත්‍ර අංකය බැංකුවට ඉදිරිපත් කළ යුතු බැවින් තාවකාලික අවසරපත්‍රයක් නිකුත් නොකර කෙලින්ම අවසරපත්‍රය නිකුත් කිරීමට පුළුවන

(6) නැවත වගා සහ පඬු ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් තාවකාලික අවසරපත්‍ර නිකුත් කිරීම අවශ්‍ය නොවේ. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් විසින් මූලික පරීක්ෂණය මගින් නිර්දේශ කරන ඉල්ලුම්පත්‍ර සඳහා අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති විට ප්‍රාදේශීය කාර්යාලය මගින් සාමාන්‍ය පරිදි අවසරපත්‍ර නිකුත් කළ යුතු අතර, එය 1990 නොවැම්බර් 30 දිනට අවසන් කළ යුතුවේ.

තවද ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පසුව 1990 නොවැම්බර් 01 දින තෙක් ලැබී ඇති නැවත වගා ඉල්ලුම්පත්‍රද මේ අනුව කටයුතු කිරීමට පුළුවන.

(ආචාර්ය සරත් බී. මනන්වත්ත)
සභාපති.

පිටපත්: 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන/ව්‍යාප්ති/මුදල්)
2. ස්ථානභාර නිලධාරීන් - උප කාර්යාල
3. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්

රූප/